## සැලකිය යුතුයි

**සැත්කමින් පසු .....**

- දින දෙකක් පමණ ගතවන තුරු විවේක ගැනීම සුදුසුය. එහෙත් එදිනෙදා ගේ දොර වැඩ කටයුතු ඔබට කර ගත හැකිය
- දින 7ක් පමණ බර වැඩ කිරීමෙන් වැළකී සිටීම සුදුසුය (උදා: දර පැලීම, වතුර ඇදීම වැනි)
- උදරයේ වේදනාවක්, යටිබඩ ප්‍රදේශයේ සුළු අපහසුතාවයන් ඇතිවිය හැකිය. මේවා ඉතා ඉක්මණින් මඟ හැරීයන අතර සරල වේදනා නාශකයක් පානය කර වේදනාව නැති කර ගැනීමට පුළුවන

**සැත්කමින් පසු ඇතිවන ඕනෑම අපහසු තත්ත්වයකදී ළඟම ඇති රෝහලෙන්/ සෞඛ්‍ය මධ්‍යස්ථානයෙන් උපදෙස් ලබා ගන්න**

## සාර්ථකත්වය

- 99% ක ටත් වඩා වැඩියි

නැවත නැවත පවුල් සැලසුම් ක්‍රම ලබා ගැනීම අවශ්‍ය නොවන නිසා, ස්ත්‍රී ස්ථිර සැත්කමින් පසු ඔබට සැහැල්ලු ප්‍රීතිමත් පවුල් දිවියකට මඟපාදා ගත හැකිය

**වැඩිදුර උපදෙස් සඳහා හමුවන්න**

- සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන්
- වෛද්‍ය නිළධාරීන්
- ලියාපදිංචි වෛද්‍ය නිළධාරීන්
- මහජන සෞඛ්‍ය හෙද සොහොයුරියන්
- පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියන්

**සුවසැරිය ✆ 1999**

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රකාශනයකි**

නිසි කල රිසි ලෙස දරු සම්පත

# ප්‍රීතිමත් යුග දිවියක් උදෙසා...



# ස්ත්‍රී ස්ථිර සැත්කම

## ස්ත්‍රී ස්ථිර සැත්කම යනු කුමක්ද?

- ස්ත්‍රියකගේ ශරීරය තුළ ඩිම්බ කෝෂයේ සිට ගර්භාෂය දක්වා ස්ත්‍රී බීජ ගමන් කරන කුඩා නාලයක් ඇත. එය පැලෝපීය නාලය නම් වේ

- ස්ත්‍රී ස්ථිර සැත්කමකදී එය අවහිර කිරීම සිදු කරයි. එමඟින් ස්ත්‍රී සහ පුරුෂ බීජ එක්වීම සිදු නොවන හෙයින් අනවශ්‍ය ගැබ්ගැනීම් වළක්වයි




## මෙය සුදුසු කාහටද?

- පවුලකට අවශ්‍ය තරම් දරුවන් ගණනක් ලබා සිටී නම් මෙම ක්‍රමය සුදුසුය.

## ස්ත්‍රී ස්ථිර සැත්කම සඳහා තිබිය යුතු අවම සුදුසු කම්

- දරුවන් දෙදෙනකු වත් සිටීම

- දෙවන දරුවාගේ වයස අවුරුදු දෙකක් වත් වීම

- ස්ත්‍රියගේ වයස අවුරුදු 26 කට වඩා වැඩිවීම



## සුදුසු කාලය

- දරු ප්‍රසුතියෙන් දින 7 ක් ඇතුළත

- දරු ප්‍රසුතියෙන් සති 06 කට පසු

- ඔසප් වීමෙන් මුල් දින 7 ඇතුළත

- දරු පිළිසිඳ ගැනීමක් සිදුවී නැති බව තහවුරු කළහැකි ඕනෑම අවස්ථාවක

## සැත්කම කරන්නේ කෙසේද?

- උදරයේ කුඩා කැපුමක්  සිදු කර මෙම සැත්කම සිදු කරයි

- සැත්කමට ගත වන්නේ මිනිත්තු 10-15 පමණ අඩු කාලයකි



## වැදගත්

- සැත්කම නිසා කොන්දේ වේදනාව, ශ්‍රෝණි වේදනාව හෝ ඔසප් චක්‍රයේ අක්‍රමිකතාවන් ඇති නොවේ

**මෙය ස්ථිර පවුල් සැලසුම් ක්‍රමයක් බැවින් නැවත දරුවන් ලබා ගැනීමට නොහැකිය**